# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/20 – 2019 දෙසැම්බර් 04 වැනි බදාදා – 2019.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ, ගැටමාන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක එච්/බීඑල්ජ්/2019/419 හා 2019.07.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වෙලන්ගහවත්තේ දෙකෙන් පංගු කැබැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0382 ක් පමණ**

උතුරට: හේවා බොස් තන්තිරිගේ ජයදීව ප්‍රියදර්ශන විසින් හිමිකම් කියන වෙලන්ගහවත්තේ දෙකෙන් පංගු කැබැල්ල, මාර්ගය සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී සහ අ.ග.පි. 296 (ගැටමාන්න) හි කැබලි අංක 1808; බටහිරට: හේවා බොස් තන්තිරිගේ ජයදීව ප්‍රියදර්ශන විසින් හිමිකම් කියන වෙලන්ගහවත්තේ දෙකෙන් පංගු කැබැල්ල.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0463 ක් පමණ**

උතුරට: මාර්ගය සහ වන්නිආරච්චි කංකානම්ගේ කරුණාවතී සහ තවත් අය හිමිකම් කියන කජ්ජුගහවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර සී; දකුණට: අ.ග.පි. 296 හි කැබලි අංක 1799, 1807 සහ 1808; බටහිරට:කැබලි අක්ෂර ඒ සහ මාර්ගය.

03. **කැබලි අක්ෂර 'සී' – කජ්ජුගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0312 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර බී සහ වන්නිආරච්චි කංකානම්ගේ කරුණාවතී සහ තවත් අය හිමිකම් කියන කජ්ජුගහවත්ත; නැගෙනහිරට: වන්නිආරච්චි කංකානම්ගේ කරුණාවතී සහ තවත් අය හිමිකම් කියන කජ්ජුගහවත්ත; දකුණට: අ.ග.පි. 296 (ගැටමාන්න) හි කැබලි අංක 1799 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2019/HW/222.
2019 ඔක්තෝබර් මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 -583

1A – G 31612 – 16 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*